# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2313/70 – 2023 ජනවාරි මස 07 වැනි සෙනසුරාදා – 2023.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/01/2016/181.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තිය යටතේ 2019.04.03 දිනැති හා අංක 2117/24 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් නුගේගොඩ, ගංගොඩවිල, පැඟිරිවත්ත පාර, අංක 72 හි පදිංචි ආර්. ජී. සුනිල් සමරවික්‍රම මයා සහ කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 හි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.11.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

බේරුම්කරු - මිබඩගේ ලීලාරත්න මැතිතුමා ඉදිරිපිටදීය.

*බේරුම්කරණ අංක:* A/35/2019.
ආරවුල් අංක : IR/COM/01/2016/181.

ආර්.ජී. සුනිල් සමරවික්‍රම මයා ඇතුළු සේවකයින් 23 දෙනා,
අංක. 72, පැගිරිවත්ත පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

පළමුවන පාර්ශවය

**එදිරිව**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ-01.

දෙවන පාර්ශ්වය

අතර පවත්නා කාර්මික ආරාවුල

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය ( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත දැක්වෙන කාර්මික ආරාවුලට හේතුපාදක වී ඇත්තේ.

'' ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැලසුම් හා සැසඳුම් සමීක්ෂණ ලිපිකරු තනතුරේ 2006 වසරේ සිට වැඩබැලීමේ පදනමින් සේවයේ නියුතු ආර්. ජී. එස්. සමරවික්‍රම මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 23 දෙනා එම තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම්, ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනයන් කවරේ ද?" යන්න පිළිබඳව වේ.

1. ආර්.ජී. එස්. සමරවික්‍රම
2. ආර්.ජී. ප්‍රියන්ත
3. ඒ.ඩී. රාජපක්ෂ
4. ඒ.ඩී.ඒ.එන්. කරුණාතිලක
5. ඒ.ඒ. සලීම්
6. එම්.බී. ඉස්මාලෙබ්බෙ
7. ආර්.ජී.ආර්.අයි. ආරියසිංහ
8. එච්.ඒ.ඒ.එන්. රුදිගු
9. එන්.එල්. ජයරත්න
10. පී.ඩී.බී.ඒ. විමලසේන
11. කේ.එම්.එස්. කේ. වික්‍රමසිංහ
12. කේ.එල්.පී. කොඩිතුවක්කු
13. ඒ.එල්. ජිෆ්රි
14. ඕ.ඩබ්.පී.බී. චන්ද්‍රසේකර
15. ඒ.පී.පී. පත්මසිරි
16. ඩී.ජේ.සී. දේවසුරේන්ද්‍ර
17. පී.ජේ. ප්‍රදීප්
18. කේ.එල්.එන්. රෝහණ
19. ටී.ජී.එච්. සිල්වා
20. ඒ.යූ. නිරෝෂන්
21. එස්.සී.ඩී. ඩයස්
22. ආර්.ජී.ඩී. සත්කුමාර
23. ජී.එම්.එස්.බී. රත්නායක

**පෙනී සිටීම.**

පළමු පාර්ශ්වය වෙනුවෙන් - නීතිඥ මෛත්‍රි පිටවල මහතා

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් - නීතිඥ පමුදි වීරසූරිය මහත්මිය ( නීති නිලධාරිනී), ආයතනය වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ මානවසම්පත් කළමණාකරු තුසිත් රෝහණ විජේරත්න ඇලපාත මහතා.

මෙම කාර්මික ආරාවුල සම්බන්ධයෙන් දෙපාර්ශ්වය විසින් සිය පළමු හා දෙවැනි ප්‍රකාශ මෙම බේරුම්කරණයට ගොනුකරන ලදුව පැමිණිලි විභාගය ආරම්භකරන ලදී. මේ අතරතුර මෙම බේරුම්කරණ යොමුවේ අංක 16 යටතේ නම සඳහන් ඩී. ජේ. සී. දේවසුරේන්ද්‍ර මහතා උසස්වීමක් ලබා ගොස් ඇති බැවින් මෙම බේරුම්කරණයෙන් ඉවත් වී ඇති බව පළමු පාර්ශ්වයේ නීතිඥවරයා විසින් බේරුම්කරණය වෙත දැනුම්දෙන ලදී. තව ද මෙම බේරුම්කරණ යොමුවේ 11 යටතේ නම සඳහන් කුරුණායක මුදියන්සේලාගේ සමන් කුමාර වික්‍රමසිංහ මහතා 2022 පෙබරවාරි මස 11 වැනි දින මිය ගොස් ඇති බවට ඔහුගේ මරණ සහතිකයේ පිටපතක් යොමු කරමින් දැනුම් දී ඇත.

**ආරාවුලේ පසුබිම**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විවිධ තනතුරුවල සේවය කරමින් සිටිය දී A 2 ලිපිය මගින් සමගි බහාලුම් පර්යන්තය වෙත ස්ථාන මාරුකිරීමෙන් අනතුරුව වැඩබලන සැසඳුම් ලිපිකරු හා සැලසුම් ලිපිකරු තනතුරුවල මෙම සේවකයන් දිගු කාලයක් තිස්සේ සේවයේ යොදවා ඇත. මෙසේ සේවයේ යෙදවීමේ දී පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහයේ 54,55,56 ( R 28 b ලේඛනය) අනුව කටයුතු නොකරමින්, අදාළ කොට්ඨාසය භාර මෙහෙයුම් කළමණාකරු විසින් එකී සේවකයන් ඉහතකී තනතුරුවල වැඩ ආවරණය සඳහා දිගු කාලයක් තිස්සේ සේවයේ යොදවා ගෙන ඇති අතර, ඔවුනට වැඩ බැලීමේ දීමනාව ගෙවීම් කර නොමැති පසුබිමක මෙම සේවකයන් විසින් විවිධ අවස්ථාවල දී බලධාරීන් වෙත තමන් සේවයේ ස්ථිර කරන ලෙසට ඉල්ලීම්කර ඇති අතර මේ සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ දී ද පැමිණිලි පරීක්ෂණයක් සිදුකර ඇත. අවසානයේ දී ආරාවුල බේරුම් කිරීමට නොහැකි තත්ත්වයක් යටතේ මෙම ආරාවුල බේරුම්කරණයෙන් සමථ කිරීම සඳහා මා වෙත යොමු කර තිබුනි.

**සාක්ෂි මෙහෙයවීම**

ප්‍රථමයෙන් ම ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් සාක්ෂිදීමට අවසර ඉල්ලන ලදුව අවසර දීමෙන් අනතුරුව අසේල ධම්මික රාජපක්ෂ විසින් සිය සාක්ෂිය දිවුරුම් ප්‍රකාශ මගින් ගොනුකරන ලදුව දෙවැනි පාර්ශ්වය විසින් එය හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලදී. තව ද පළමු පාර්ශ්වය වෙනුවෙන්. චමිල ඉන්ද්‍රික ආරියසිංහ මහතා විසින් ද සාක්ෂි ලබාදීමෙන් අනතුරුව එම සාක්ෂිය ද දෙවැනි පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලදී.

ඉන් අනතුරුව දෙවැනි පාර්ශ්වය විසින් තම නඩුව ආරම්භකරන ලද අතර, ප්‍රථමයෙන්ම ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කළමණාකරු වන තුසිත් රෝහන් ඇලපාත මහතා සාක්ෂි ලබාදෙන ලදුව පළමු පාර්ශ්වය විසින් එය හරස් ප්‍රශ්නවලට භාජනය කරන ලදී. ඉන් අනතුරුව දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු ජයන්ත වීරවික්‍රම මහතා සාක්ෂිදීමෙන් අනතුරුව එම සාක්ෂිය පළමු පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්නවලට භාජනය කිරීමෙන් අනතුරුව දෙවැනි පාර්ශවයේ සාක්ෂි විමසීම් අවසන් කරන ලදී. ඒ අනුව නඩුවේ සාක්ෂි විමසීම් අවසන් වූ අතර අවසන් ලිඛිත දේශන ගොනු කිරීම සඳහා දින ලබාදීමෙන් අනතුරුව බේරුම්කරණ විභාගයේ කටයුතු අවසන් කරන ලදී.

**සාක්ෂි විශ්ලේෂණය**

මෙම ඉල්ලුම්කාර සේවකයින් අතුරින් 2006 වසරේ දී වැඩ බැලීමේ තනතුරු සඳහා අනුයුක්තකර ඇත්තේ සේවකයින් 12 දෙනෙකු පමණි. අනිකුත් සේවකයන් අතරින් සේවකයන් 5 දෙනෙකු 2009 වසරේ සිට ද, එක් අයකු 2008 වසරේ සිට ද, සේවකයන් දෙදෙනෙකු 2010 වසරේ සිට ද, තවත් සේවකයින් දෙදෙනෙකු 2013 වසරේ සිට ද මෙම අංශයට ස්ථානමාරු කොට ඉන් අනතුරුව රාජකාරි ආවරණය කිරීමේ කටයුතු සිදුකර ඇති බව සාක්ෂි මගින් අනාවරණය විය. ඒ බවට දෙවැනි පාර්ශ්වයේ අවසාන ලිඛිත දේශනයෙන් ද කරුණු අනාවරණය කර ඇත.

මෙම සාක්ෂි පිළිබඳව ඉතා සූපරීක්ෂාකාරීව නිරීක්ෂණය කිරීමෙන් පැහැදිලි වූ කරුණක් වූයේ මෙම සේවකයන් සිය වෘත්තීය සමිති මාර්ගයෙන් එවකට වරාය අධිකාරියේ පැවති අවශ්‍යතාවය පදනම්කර ගනිමින් සමගි බහාලුම් පර්යන්තය වෙත ස්ථාන මාරුවීමක් ලබාගැනීමට කටයුතු කර ඇති බවයි. කෙසේ වෙතත් මෙම සේවකයන් අනිවාර්යෙන්ම මෙම ස්ථාන මාරුව සිදුකර ඇත්තේ එවකට අළුතින් පටන් ගත් මෙම පර්යන්තයේ සේවා මුර තුනක් යටතේ කටයුතු මෙහෙයවීම ආරම්භ කිරීම සඳහා සේවකයන් අවශ්‍යවීමේ හේතුව මත බව ඉතාමත්ම පැහැදිලි වූ කරුණකි. තව ද, මෙම සේවකයින් මෙම අංශයට අනුයුක්ත කිරීමෙන් අනතුරුව අද වන තෙක්ම කිසිදු අවස්ථාවක ඔවුන්ගේ මුල් තනතුරෙහි සේවයෙහි යොදවා නොමැති බව බේරුම්කරු විසින් කරන ලද විමසීමකට පිළිතුරු ලෙස සාක්ෂිකරු සාක්ෂි ලබාදී ඇත. එනම්

" ගොනුවේ පිටු අංක 260 ඇති 2019-12-12 සාක්ෂි සටහන්වල 11 පිටුවේ.

ප්‍ර. තමුන් සාක්ෂි දෙමින් කිව්වා සමගි බහාලුම් පර්යන්තයේ සැසඳුම් ලිපිකරු තනතුරට පත්කළා කියල?

පි. ඔව්.

ප්‍ර. පත්කළාට පස්සේ එතන සේවය කරන අතරතුර තමුන් කොයි අවස්ථාවක හරි තමුන්ගේ ස්ථිර තනතුරේ යෙදෙව්ව ද ?

පි. කවදාවත් නෑ.

ප්‍ර. මේ අවුරුදු 13 ට ම නෑ?

පි. නෑ.

මෙම සාක්ෂි මෙහෙයවීමේ දී පළමු පාර්ශ්වය විසින් සලකුණු කරන ලද A 5 ලේඛනය මගින් සේවකයන්ට සැසඳුම් සමීක්ෂණ ලිපිකරු සහ තටාක ලිපිකරුගේ රාජකාරි ලැයිස්තු ලබා දී ඇති බවට සනාථ කර ඇත. එම රාජකාරි ලැයිස්තු සම්බන්ධයෙන් දෙවැනි පාර්ශ්වය කිසි විටකත් සිය විරෝධය පලකර නොමැති අතර, ඒ සම්බන්ධයෙන් හබ කිරීමක් ද කර නැත.

තව ද. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මානව සම්පත් කළමණාකරණ අංශය දැනුවත් නැති බවට දෙවැනි පාර්ශ්වය ප්‍රකාශ කළද පළමු පාර්ශ්වය විසින් මෙම ගොනුවට ගොනුකරන ලද ගොනුවේ පිටු අංක 309. 310. 311 දරන ඇමුණුම් 01 මගින් ඉදිරිපත් කර ඇති වරාය අධිකාරියේ කළමණාකරණය මගින් නිකුත්කර ඇති ලිපි මගින් මානව සම්පත් කළමණාකරණ අංශය මේ සම්බන්ධයෙන් දැනුවත් වී ඇති බව මනාව තහවුරු වී ඇත. මන්ද යත් කිසිදු අවස්ථාවක එම ලිපි සම්බන්ධයෙන් දෙවැනි පාර්ශ්වය හබ කිරීමක් ද කර නැත.

සමස්ථ සාක්ෂි මෙහෙයවීම හා දෙපාර්ශ්වයේ ලිඛිත දේශන හා පළමු හා දෙවැනි ප්‍රකාශ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී මනාව පැහැදිලි වන තත්ත්වය නම්, වරාය අධිකාරිය විසින් සිය සේවා අවශ්‍යතා පදනම් කර ගනිමින්, වෘත්තීය සමිතියෙන් නිර්දේශිත පුද්ගලයන් වෙනත් අංශවලින් සමගි බහාලුම් පර්යන්තය වෙත ස්ථාන මාරුකර ඇති බවත්, එහි දී මෙම සේවකයන් තම මුල් තනතුරෙහි නොව සැසඳුම් හා සැලසුම් සමීක්ෂණ ලිපිකාර තනතුරේ රාජකාරි කටයුතුවල පමණක් යොදවා ගෙන ඇති බවයි. දෙවැනි පාර්ශ්වය මෙම රාජකාරි ආවරණය කිරීම සම්බන්ධයෙන් කිසි විටක හබකර නොමැති අතර, ඔවුන් දිගින් දිගටම උත්සාහ කරනු ලැබුවේ මෙම වැඩබලන පත්වීම් නිසි ක්‍රමවේදය අනුව සිදු වී නොමැති බව තහවුරු කිරීමට පමණි. එහෙත් විමසා බැලිය යුතු විශේෂ කරුණ වනුයේ පරිපාලන කාර්ය සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කිරීමේ වගකීම පැවරෙනුයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකරණයට ද? එසේ නැත්නම් සේවකයන් වෙත ද යන කරුණ පිළිබඳව වේ. ඒ සම්බන්ධයෙන් සලකා බලන විට එකී පරිපාලන කාර්යය සංග්‍රහයේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකාරිත්වය බැඳී සිටින බවට විවාදයක් නැත. සේවකයන්ට සිදුවන්නේ එකී නියෝග අනුව කටයුතු කිරීමට පමණි. මෙම විභාගයේ දී දෙවැනි පාර්ශ්වය වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම සේවකයන් මෙසේ සැසඳුම් හා සැලසුම් ලිපිකරු තනතුරේ සේවයේ යෙදවීම පිළිබඳ මානව සම්පත් අංශය දැනුවත් නොමැති බව පැවසුව ද, එම ප්‍රකාශය සත්‍යයෙන් තොර ප්‍රකාශයක් බව තහවුරු වන්නේ මෙම ස්ථාන මාරුවීම් හා අනුයුක්තයන් සම්බන්ධයෙන් සෑම විටම මානව සම්පත් කළමණාකරණ අංශය දැනුවත් කිරීම් සිදුකර ඇති බවට සලකුණු කරන ලද ඇමුණුම් හා ලේඛන මගින් තහවුරු කිරීමත් එම ඇමුණුම් හා ලේඛන සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක දෙවැනි පාර්ශ්වය හබකර නොතිබීමත් යන කරුණ වේ. ඒ අනුව මෙම සේවකයන් වෙත වැඩබැලීමේ පත්වීම් ලිපියක් ලබානොදීම සම්බන්ධයෙන් වග කීමට බැඳෙනුයේ මානව සම්පත් කළමණාකරණ අංශය බව මනාව පැහැදිලි වේ. මෙම වැඩබැලීමේ පත්වීම් දීම පවතින ක්‍රමවේදයට පටහැනි නම් මානව සම්පත් කළමණාකරන අංශය ඒ සම්බන්ධයෙන් පියවර ගත යුතුව තිබුණි. එහෙත් වසර 13 කට අධික කාලයක් තිස්සේ වැඩ බැලීමේ දීමනාව ගෙවීමෙන් තොරව අද දක්වා ම මෙම සේවකයින්ගෙන් රාජකාරි ආවරණය කර ගැනීමේ කාර්යයේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය නියුක්තව සිටීම සම්බන්ධයෙන් නිදහසට කරුණු කිසිවක් ඉදිරිපත් කිරීමට දෙවැනි පාර්ශ්වය අසමත් වී ඇති බව පැහැදිලි වේ.

මෙහි දී විශේෂයෙන්ම දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කළමණාකාර ඩබ්.ටී.ආර්. ඇලපාත මහතා විසින් 2020-08-14 දින සාක්ෂි ලබාදෙමින් සාක්ෂි සටහන්වල 20 වැනි පිටුවේ හෙවත් ගොනුවේ 416 පිටුවේ සිය සාක්ෂි මෙසේ ලබා දී ඇත.

'' ප්‍ර. මේ රීතියට අනුව එම කොට්ඨාසයේ ප්‍රධානියාට ඔහුගේ කොට්ඨාසයේ අදාළ රාජකාරි සඳහා කාර්යයන් ගැන යොදවා ගැනීමේ අයිතියක් තියෙනව කියලා කියන්න පුළුවන් ද?

පි. එක් එක් කොට්ඨාසයේ කළ යුතු කාර්යය සඳහා සේවකයින් යොදවා ගැනීම කොට්ඨාස අංශ ප්‍රධානින් මගින් සිදුකරනු ලබනවා. නමුත් යම් තනතුරක් සඳහා සේවකයකු ස්ථිර වශයෙන් පත්කිරීමට සහ <u>වැඩ ආවරණය කිරීම සඳහා යෙදවීම මානව සම්පත් කොට්ඨාසය මගින් තමයි සිදුකරන්නෙ</u>.

2022-05-25 දින සාක්ෂි සටහන්වල 4 වැනි පිටුවේ ගොනුවේ 551 (පසුපිට) පිටුවේ දෙවැනි පාර්ශ්වයේ සාක්ෂිකාර ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු ජයන්ත වීරවික්‍රම මහතා සාක්ෂි ලබා දෙමින් මෙසේ ප්‍රකාශ කර ඇත. එනම්,

"ප්‍ර. අඩුපාඩු නැද්ද සේවකයන්ගේ?

පි. දැනටත් අඩුපාඩු තියෙනව.

ප්‍ර. මේගොල්ල ගත්තෙ විවිධ තනතුරුවලින් වැඩබැලීමේ පදනම යටතේ ද?

පි. ඔව්. විවිධ තනතුරුවල අය වැඩබලන පදනම යටතේ ගත්තා.

ප්‍ර. පත්වීම කොහොමද ලබාදීල තියෙන්නේ ?

පි. ඒ පත්වීම ලබාදීල තියෙන්නෙ අපි වැඩ ආවරණය කිරීම සඳහා.

මෙම සාක්ෂි කරුවන් දෙදෙනා පරස්පර විරෝධී සාක්ෂියක් ලබාදී ඇති බව පැහැදිලි වන්නේ දෙවැනි පාර්ශ්වයේ පළමු සාක්ෂිකරු වන ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කළමණාකරු විසින් පිටු අංක 416 ලබා දී ඇති ඉහත සඳහන් සාක්ෂිය අනුව වැඩ ආවරණය කිරීම සඳහා යෙදවිය යුත්තේ මානව සම්පත් කොට්ඨාසය මගින් බවට පවසා ඇතත්, ප්‍රධාන ක්‍රියාකරවන කළමණාකරු විසින් ගොනුවේ පිටු අංක 551 දී ලබාදී ඇති සාක්ෂිය මගින් තහවුරු කර ඇත්තේ තමන් විසින් එම වැඩ ආවරණය කිරීමේ පත්වීම ලබාදී ඇති බවයි. මෙම තත්ත්වය කළමණාකරණ තීරණවල ඇති ගැටලුවක් මිස සේවකයන් වගකිවයුතු තත්ත්වයක් නොවන බව මනාව පැහැදිලි වේ. එහෙත් දෙවන පාර්ශ්වයේ දෙවැනි සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි ලබා දෙමින් පවසා ඇත්තේ මෙම වැඩ ආවරණය කිරීමේ පත්වීම් ලබාදීම සම්බන්ධයෙන් මානව සම්පත් කළමණාකරන අංශය මැදිහත් වී බවයි. එනම්

2022-06-23 දින සාක්ෂි සටහන්වල 11 පිටුව ගොනුවේ 461 පිටුවේ දෙවැනි සාක්ෂි කරුගේ සාක්ෂියෙහි මෙසේ සටහන්ව ඇත.

" ප්‍ර. ඒ අනුව යම්කිසි තනතුරක් ස්ථිර හෝ වැඩ බැලීමේ පදනමින් හෝ මොනම තත්ත්වයෙන් දුන්නත් ඒක දෙන්න ඕනෙ ආයතනයේ ඉහළ පරිපාලනය විසින්?

පි. මානව සම්පත් කොට්ඨාසය විසින්

ප්‍ර. ඒ අනුව මේ සැලසුම් ලිපිකරුවන්ට හා සැසඳුම් ලිපිකරුවන්ටත් වැඩබැලීමේ පත්වීම් ලබාදුන්නේ මානව සම්පත් කොට්ඨාසයේ මැදිහත්වීම අනුව?

පි.ඔව්.

ප්‍ර. කොහොමද එහෙම කියන්නෙ?

පි. මානව සම්පත් අංශයෙන් මේ අය බොහෝ වෙලාවට වැඩ සහයක කියන තනතුරෙන් තමයි ටර්මිනල් එකට ආවේ. ටර්මිනල් එකේ කළමණාකාරිත්වය කියන්නේ අපි ක්‍රියාකරවන කොට්ඨාසයේ බලධාරින් වශයෙන් ඒ අයගේ සුදුසුකම් පරීක්ෂා කරලා බලලා බහාලුම් මෙහෙයුම් පද්ධතියට ඕනෑ කරන සේවයක් සඳහා යොදා ගන්නවා.

මේ සම්බන්ධයෙන් මානව සම්පත් අංශය දැනුවත්ව කටයුතු කර ඇති බවට තවදුරටත් තහවුරු වන්නේ පළමු පාර්ශ්වය විසින් සලකුණු කරන ලද A 18 ලිපිය පිටපතක් මානව සම්පත් අංශයට යොමුකර ඇති බවට දෙවැනි පාර්ශ්වයේ දෙවැනි සාක්ෂිකාර වීරවික්‍රම මහතා පිළිගෙන තිබීමෙනි. එම කොටස A 18 ඒ ලෙසට සලකුණු කර ඇත. මෙම ලිපිය සම්බන්ධයෙන් දෙවැනි පාර්ශ්වය විරෝධතාවයක් පළකර නොමැති අතර, හබකිරීමක් ද සිදුකර නොමැත.

සමස්ත බේරුම්කරණ විභාගය පුරාවටම පළමු පාර්ශ්වය වන සේවකයන් විසින් තමන් වැඩ ආවරණය කිරීමේ තනතුරෙහි සේවයේ යොදවන බව තහවුරු කර ඇති අතර දෙවැනි පාර්ශ්වය විසින් ද එය පිළිගෙන ඇති නමුත් ඔවුන්ගේ තර්කය වී ඇත්තේ මෙම සේවකයන් වෙනුවෙන් වැඩ ආවරණය කිරීම සඳහා මානව සම්පත් අංශයෙන් ලිඛිත අවසරයක් ලබා දී නොමැති බව පමණක් වේ. තවදුරටත් දෙවැනි පාර්ශ්වය විසින් තහවුරු කිරීමට උත්සාහ කරනු ලැබුවේ මෙම සේවකයන් වෘත්තීය සමිති මාර්ගයෙන් මෙම අංශයට අනුයුක්ත වූ බව හා පරිපාලන කාර්ය සංග්‍රහය අනුව වැඩ බලන සේවකයකු ලෙස සේවයේ යෙදීමෙන් ස්ථිර පත්වීමක් ලැබීම සඳහා සුදුසුකම් නොලබන බවයි.

ඉහත සියලු සාක්ෂි හා ලේඛන විශ්ලේෂණය කිරීමෙන් පහත නිගමනවලට එළැඹියෙමි.

1. වෘත්තිය සමිතියක මැදිහත් වීමකින් වුව ද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවා අවශ්‍යතාවය අනුව මෙම සේවකයන් අදාළ පරියන්ත වෙත ස්ථාන මාරු කර ඇත.
2. මානව සම්පත් අංශයෙන් නිකුත්කරන ලද ලිඛිත වැඩ ආවරණය කිරීමේ ලිපියක් නොමැති වුව ද, කොට්ඨාස ප්‍රධානී වන මෙහෙයුම් කළමණාකාර තැන විසින් මොවුන් වැඩ ආවරණ කිරීමේ තනතුරුවල යොදවා ඇති බව පමණක් නොව, විවිධ අවස්ථාවල රාජකාරි ලැයිස්තු නිකුත් කිරීමෙන් මෙන්ම විවිධ කටයුතු සඳහා මොවුන් ආවරණ සේවයේ යෙද වූ නිල නාමය භාවිත කර ඇති බව.
3. අදාළ රාජකාරි ආවරණය කිරීමේ කටයුතු වෙනුවෙන් දිරි දීමනා ගෙවා ඇති බව.
4. මානව සම්පත් අංශයෙන් ලිඛිත වැඩ ආවරණය කිරීමේ ලිපි නිකුත්කර නොමැති වුව ද, මෙම තනතුරුවල වැඩ ආවරණය කිරීම පිළිබඳව මානව සම්පත් අංශය ප්‍රමාණවත් දැනුමකින් යුක්ත සිට ඇති බව.
5. මෙම සේවකයින් පිරිස අධික කාලයක් තිස්සේ අද දක්වාම සැලසුම් ලිපිකරු හා සැසඳුම් ලිපිකරු තනතුරුවල වැඩ ආවරණය කිරීමේ කටයුතුවල නියුක්ත කර සිටින බව.
6. මෙම සේවකයන් ද මෙවැනි සේවා ස්ථානවල සේවය කිරීමට වැඩි රුචිකත්වයක් දක්වන බව.
7. තවදුරටත් මෙම සේවකයන් මෙසේ ආවරණ සේවයේ යෙදවීම තුළින් පැහැදිලි වනුයේ මෙම සේවකයන්ගේ සේවා අවශ්‍යතාවය ශ්‍රී ලංකා වරාය අධිකාරියට ඇති බව.
8 ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැන දැනම වඩා වැඩි වැටුපක් ගෙවිය යුතු තනතුරු සඳහා අඩු වැටුපක් හා පහළ නිලයන් දරන සමහර සේවකයන් සේවයේ යොදවාගෙන ඇති බව හා ඔවුනට ගෙවිය යුතු වැඩ බැලීමේ දීමනාව ගෙවා නොමැති බව.
9. එසේ සේවයේ යොදවා ගැනීම තුළින් මෙම සේවකයන්ට යම් අසාධාරණයක් සිදුවී ඇති බව.

ඉහත සියලු කරුණු සලකා බලා පහත පරිදි මාගේ ප්‍රදානය ලබාදෙමි.

**ප්‍රදානය**

මුලින්ම සලකා බැලිය යුත්තේ මෙම ආරාවුලට පාදක වී ඇති යොමුවේ සඳහන් කාර්මික ආරාවුල සම්බන්ධයෙන් කුමණ තීරණයක් ගත යුතු ද යන බවයි. එකී ආරාවුලට හේතු වූ කරුණ නම්.

" ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සැලසුම් හා සැසඳුම් සමීක්ෂණ ලිපිකරු තනතුරේ 2006 වසරේ සිට වැඩ බැලීමේ පදනමින් සේවයේ නියුතු ආර්. ජී. එස්. සමරවික්‍රම මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 23 දෙනා එම තනතුරේ ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ."

මෙහි දී සියලුම කරුණු සලකා බැලීමෙන් අනතුරුව මෙම යොමුවේ ප්‍රශ්නයට සාධාරණත්වය පදනම් කරගනිමින් පිළිතුරු ලබාදීමේ ලබාදිය යුතු එකම පිළිතුර වන්නේ අසාධාරණයක් සිදුව තිබේ යන්න වේ.

ඊට හේතුව වන්නේ වසර 10,15 වැනි දිගු කාලයක් තිස්සේ මෙම සේවකයන් වැඩ ආවරණය කිරීමේ කටයුතුවල යොදවා ගැනීමෙන් ආයතනය කිසිදු අතිරේක ගෙවීමකින් තොරව එසේ වැඩ ආවරණය කරන ලද තනතුරට අදාළ සියලු කාර්යයන් මෙම සේවකයන් ලවා අද දක්වාම ඉටුකරවා ගනිමින් සිටීමත්, මෙසේ දිගු කාලයක් එසේ රාජකාරි ආවරණය කිරීම තුළින් මෙම සේවකයින්ගේ සිත් තුල තමන් එම තනතුරේම සේවකයෙකු යන විශ්වාසය ඇති වී තිබීමත්, ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් මෙම සේවකයින් වැඩ ආවරණය කරන තනතුරුවල දිගු කාලයක් යොදවා ගනිමින් එම තනතුරු වලට හිමි වැටුප් නොගෙවා අඩු වැටුපක් ගෙවමින් සේවාවන් ලබා ගැනීම අසාධාරණ ක්‍රියාවක් බවත් වේ.

ඉන් අනතුරුව සලකා බැලිය යුත්තේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහනය කුමක් ද යන්න වේ.

මෙහි දී ලබාදිය යුතු සහනය පිළිබඳව තීරණය කිරීමේ දී වරාය අධිකාරිය වැනි රජයේ ඉතා වැදගත් මර්මස්ථානයක් සම්බන්ධයෙන් ඉතාමත් සියුම්ව කරුණු සලකා බලා සහන පිරිනැමිය යුතු වේ. මන්ද යත් මෙවැනි විශාල සේවක සංඛ්‍යාවක් සිටින මේ ආකාරයේම වැඩ ආවරණ කරන සේවකයන් විශාල පිරිසක් සේවයේ නියුතු ආයතනයක් සම්බන්ධයෙන් ඉහත සේවකයන් ස්ථිර සේවයේ යොදවා ඔවුනට හිඟ වැටුප් ගෙවීමට නියෝගයක් කළහොත් එය ආයතනයේ පැවැත්ම කෙරෙහි දැඩි බලපෑමක් එල්ලවිය හැකි බව හා ඒ තුළින් සමස්ථ ආයතන පද්ධතියම අර්බුදයකට තල්ලු විය හැකි බව වේ. ඒ අනුව සලකා බලා පහත පරිදි මාගේ ප්‍රදානය යුක්ති සහගත සහ සාධාරණත්වය යන කරුණු සලකා බලා මෙන්ම දෙවැනි පාර්ශ්වය සිය ලිඛිත දේශන මගින් දක්වා තිබූ නඩු තීන්දු කෙරෙහි ද සැලකිල්ල යොමු කරමින් ආයතනය හා සේවක පිරිස යන දෙපාර්ශ්වයම පිළිබඳ සිතා බලා මෙම සේවකයන් අතරින් යොමුවේ අංක 16 දරන ඩී.ජේ. සී. දේවසුරේන් යන අය හැර ඉතිරි සේවකයින් 22 දෙනා මෙම ආරාවුල මා වෙත යොමුකර තිබූ 2019-03-26 දින සිට බලපැවැත්වෙන පරිදි ඔවුන් වැඩ බලන තනතුරේ හිඟ වැටුප් රහිතව ස්ථිර කරන ලෙසට නියම කරමි. ඒ අනුව,

1. පහත නම් සඳහන් සේවකයන් 22 දෙනා ඔවුන් වැඩ බලන තනතුරෙහි එනම් සැලසුම් හා සැසඳුම් සමීක්ෂණ ලිපිකරු තනතුරෙහි හිඟ වැටුප් රහිතව 2019-03-26 දින සිට බලපැවැත්වෙන පරිදි ස්ථිර කරන ලෙසට මෙයින් නියම කරමි.

01. ආර්.ජී.එස්.සමරවික්‍රම
02. ආර්.ජී.ප්‍රියන්ත
03. ඒ.ඩී.රාජපක්ෂ
04. ඒ.ඩී.ඒ.එන්.කැරණාතිලක
05. ඒ.ඒ.සලීම්
06. එම්.බී.ඉස්මාලෙබ්බේ
07. ආර්.ජී.ආර්.අයි.ආරියසිංහ
08. එච්.ඒ.ඒ.එන් රුදිගු
09. එන්.එල්.ජයරත්න
10. පී.ඩී.බී.ඒ.විමලසේන
11. කේ.එම්.එස්.කේ.වික්‍රමසිංහ
12. කේ.එල්.පී.කොඩිතුවක්ක
13. ඒ.එල්.ජිෆ්රි
14 .ඕ.ඩබ්.පී.බී.චන්ද්‍රසේකර
15. ඒ.පී.පී.පත්මසිරි
16. පී.ජේ.ප්‍රදීප්
17. කේ.එල්.එන්.රෝහණ
18. ටී.ජී.එච්.සිල්වා
19. ඒ.යූ.නිරෝෂන්
20. එස්.සී.ඩී.ඩයස්
21. ආර්.පී.ඩී.සත්කුමාර
22. ජී.එම්.එස්.බී.රත්නායක

2. මෙම සේවකයන්ගේ සේවය මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළකරන ලද දිනයේ සිට මාස තුනක් ඇතුළත ප්‍රදානයේ පරිදි ස්ථිර කොට ඔවුන් වෙත ස්ථිර පත්වීම් ලිපි ලබා දී ඒ බව දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් තුමා දැනුවත් කරන ලෙසට ද නියම කරමි.

3. මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව ද සහතික කරමි.

**ඕබඩගේ ලීලාරත්න,**
බේරුම්කරු.

EOG 01-0049